කොටුව දුම්රිය ස්ථානයේ සිට මඩකළපුව බලා ධාවනය කිරීමට නියමිතව තිබූ මීනගයා දුම්රියේ වැසිකිළියක මාර්තු 10, 2023 දින රාත්‍රියේ දමාගොස් තිබියදී හමුවූ බිළිඳාගේ දෙමාපියන්ව හඳුනාගෙන, ඔවුන්ව අත්අඩංගුවට ගැනීමත්, ඒ සම්බන්ධ විමර්ශණ සහ බිළිඳාගේ මවගෙන් පොලිසිය කටඋත්තර ගැනීමත්, මාර්තු 11, 2023 දිනය තුළ රූපවාහිනී රාත්‍රී සිංහල ප්‍රධාන සිංහල පුවත් තුළ ආවරණය වී තිබුණි. එසේම, මෙම සිදුවීම සමාජ මාධ්‍ය තුළ පුළුල් අවධානයක් අත්පත් කොටගත් අතර, එහිදී, සිදුවෙමින් පවතින පොලිස් විමර්ශනයක සැකකාර මව කටඋත්තර ලබාදීම මාධ්‍ය ඔස්සේ පෙන්වීම ඇතුළුව මාධ්‍ය ක්‍රියා කළ ආකාරය සම්බන්ධයෙන් බොහෝ විවේචනයන් ද සමාජ මාධ්‍ය ඔස්සේ එල්ල වී තිබිණි.

1) සැකකාර දෙමාපියන්ගේ අනන්‍යතාවය, සිදුවීමේ විමර්ශන අවසන් වීමටත් පෙර හෙළි කිරීම කෙතරම් යෝග්‍ය වන්නේ ද?

2) මෙම සිදුවීම හැඟීම් කළඹවන සුළු ආකාරයකින් ඉදිරිපත් කිරීම ඔස්සේ, සිදුවීම අපක්ෂපාතීව හා සමබරව ප්‍රේක්ෂකයන් වෙත ඉදිරිපත් වන්නේ ද?

3) ඒ අනුව, මෙම සිදුවීම වාර්තා කළ මාධ්‍ය අතුරින්, වඩාත් ආචාර ධාර්මික යැයි තෝරාගත හැක්කේ කුමන පුවත් වාර්තාකරණය ද?

(YouTube වෙත එක් කොට තිබූ, මාර්තු 11, 2023 දින රාත්‍රී රූපවාහිනී ප්‍රධාන සිංහල පුවත් විකාශයන් හි සිරස්තල ඇසුරිණි. මෙහිදී හිරු ටීවී පුවත් ආවරණය තුළ, ළමා හිංසනයන් දැනුම් දීම සඳහා හදිසි සේවා අංකයක් ද සඳහන් කර තිබූ බව ද නිරීක්ෂණය කළ හැකි විණි.)

**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.

*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!

